www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# උත්තර ධ්‍රැවයේ පරිසරය පිලිබඳ විද්‍යාත්මක වාර්තාව නිකුත් කිරීමට එක්සත් ජනපදය බාධා පමුනුවයි

**US blocks scientific report on Arctic environment**

**නියල් ග්‍රීන් විසිනි**
**2008 පෙබරවාරි 5**

උත්තර ධ්‍රැව කලාපයේ (ආක්ටික්) ඛනිජ තෙල් හා ගෑස් සඳහා කෙරෙන කැනීම් කටයුතුවල බලපෑම පිලිබඳ වැදගත් තොරතුරු අඩංගු පරිපූර්න තක්සේරුවක් ඉදිරිපත් කිරීමට එක්සත් ජනපදය විසින් බාධා පමුනුවා ඇත. මෙම වාර්තාව සකස් කිරීමට වසර හයක් ගතවී ඇත. එක්සත් ජනපදය ද සාමාජිකයෙකු වන උත්තර ධ්‍රැව මන්ඩලය නම් ජාත්‍යන්තර සංවිධානයේ විද්‍යාඥයින් පිරිසක් විසින් වාර්තාව පිලියෙල කරනු ලැබිනි.

"උත්තර ධ්‍රැවයෙහි ඛනිජ තෙල් හා ගෑස් පිලිබඳ තක්සේරුවක්" යන හිසින් යුත් මෙම වාර්තාව, ආක්ටික් මන්ඩලයේ සාමාජිකයින් වන රටවල් අටෙහි (කැනඩාව, නෝර්වේ, ඩෙන්මාර්කය, ස්වීඩනය, රුසියාව, ෆින්ලන්තය, අයිස්ලන්තය, හා එක්සත් ජනපදය) විද්‍යාඥයින් විසින් කරන ලද පර්යේෂනවල වඩාත්ම පරිපූර්න වූ අධ්‍යයනය සපයනු ඇතැයි අපේක්ෂා කෙරින.

උත්තර ධ්‍රැව බල ශක්ති සංචිත අනාගතයෙහි ප්‍රයෝජනයට ගැනීමේ කලමනාකරන කටයුතු වෛෂයික හා විද්‍යාත්මක පදනමක පිහිටුවාලීමේ උත්සාහයක පූර්න වාර්තාව එලිදැක්වීමට එක්සත් ජනපද නියෝජිතයින් බාධා පමුනුවීම ගැන නෝර්වේහි ට්‍රොම්සෝ නගරයෙහි ජනවාරි 21 වැනි දා වාර්තාව නිකුත් කරන අවස්ථාවේ දී රැස්ව සිටි විද්‍යාඥයෝ " සිය බලවත් කනස්සල්ල"පල කලහ. නිල නොවන ප්‍රකාශයක් තුල වාර්තාවේ කතුවරයෙක් කියා සිටියේ එක්සත් ජනපද ආන්ඩුව මෙම ලියවිල්ලේ ප්‍රායෝගික නිගමන ප්‍රකාශයට පත් කිරීම වලක්වා ඇති බවත් " සරල බසින් පල කල නිගමන" කපා හැර ඇති බවත්ය.

වාර්තාව සකස් කිරීමේ අරමුන වූයේ උත්තර ධ්‍රැවයෙහි ඛනිජ තෙල් හා ගෑස් නිධි පිලිබඳ කැනීම් කටයුතුවල බලපෑම පිලිබඳව සවිස්තරාත්මක චිත්‍රයක් ඉදිරිපත් කිරීම ය. මේ කලාපයෙහි ලොව මෙතෙක් ප්‍රයෝජනයට නොගත් හයිඩ්‍රෝකාබන් නිධිවලින් තුනෙන් පංගුවක් ඇතැයි ගනන් බලා ඇත.

වාර්තාවෙහි අරමුන උත්තර ධ්‍රැව මන්ඩලයේ වෙබ් අඩවිය මෙසේ පැහැදිලි කරයි:

"උත්තර ධ්‍රැවයෙහි ඛනිජ තෙල් සහ ගෑස් සම්පත් සෙවීමේ කැනීම් කටයුතුවල පාරිසරික, සමාජීය හා ආර්ථික මානව සෞඛ්‍ය බලපෑම් සම්බන්ධව සෑම පැත්තකින් ම සොයා බලා තක්සේරුවක් ඉදිරිපත් කිරීම, ඛනිජ තෙල් හා ගෑස් පර්යේෂන කටයුතු වර්ධනය විය හැකි අන්දම හා නුදුරු අනාගතයේ ඒවායේ විභව බලපෑම් සම්බන්ධයෙන් අගැයීමක් කිරීම ඛනිජ තෙල් හා ගෑස් සෙවීමේ දී යහපත් අනාගත කලමනාකරනයට සහාය වීම සඳහා තීරන ගැනීමේ නියුතු පුද්ගලයන්ට මෙම තක්සේරුව තුලනාත්මක හා විශ්වාසනීය ලියවිල්ලක් ලෙස ඉදිරිපත් කිරීම" මෙහි අරමුන ය.

කලාපයෙහි ඛනිජ තෙල් හා ගෑස් නිෂ්පාදනය සම්බන්ධ තක්සේරුවක් කිරීම සඳහා සහයෝගිතාවයෙන් කටයුතු කරන ලෙස 2002 වසරේ දී උත්තර ධ්‍රැව මන්ඩලයේ ඇමතිවරු ඉල්ලා සිටියහ. උත්තර ධ්‍රැව අධීක්ෂන හා තක්සේරු වැඩ පිලිවෙල මගින් සංවිධානය කරන ලද මෙම විද්‍යාත්මක තක්සේරුව පිලියෙල කිරීමෙහි ලා 2004 හා 2007 අතර වසරවල දී කලාපීය රටවල විද්‍යාත්මක හා ආර්ථික විශේෂඥයින් ද, ස්වදේශික මහජන සංවිධානවල හා ඛනිජ තෙල් හා ගෑස් කර්මාන්තයෙහි නියෝජිතයින් ද සහභාගි වූහ.

මෙම වාර්තාවට පහත සඳහන් පරිච්ඡේද අඩංගුවේ: ඛනිජ තෙල් හා ගෑස් නිෂ්පාදන කටයුතු; එහි සමාජ ආර්ථික බලපෑම්; හයිඩ්‍රොකාබන් මුදාහැරීම නිසා පරිසරය මත සිදුවන බලපෑම; මානව සෞඛ්‍ය කෙරෙහි වන බලපෑම් ද ඇතුලුව ආසාදන තත්වයන් හා ජීවීන්ට සිදුවන විවිධ මට්ටමේ බලපෑම්; හා පරිසර පද්ධතිය මත විභව බලපෑම්. වාර්තාව ප්‍රකාශ කිරීමට ප්‍රථමයෙන් එය මන්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත ඉදිරිපත් කරන ලදී. එනමුදු, එක්සත් ජනපද නියෝජිතයින්ගේ බලපෑම් මත මෙම මාතෘකාවලින් එලැඹුනු නිගමන ඉවත් කරන්නට යෙදුනි. සමස්ත තක්සේරුව හා නිර්දේශ ඉදිරිපත් කිරීම ද වලක්වන ලදී.

බ්‍රිතාන්‍යයෙහි ඉන්ඩිපෙන්ඩන්ට් පුවත්පත රැස් කර ගත් තොරතුරු හා නිර්දේශ සහිත කෙටුම්පත අධ්‍යයනය කල බ්‍රිතාන්‍යයේ ඉන්ඩිපෙන්ඩන්ට්

පුවත්පතට අනුව උත්තර ධ්‍රැවයෙහි පාරිසරික වසයෙන් සංවේදී ප්‍රදේශවල අලුතින් ඛනිජ තෙල් හා ගෑස් ව්‍යාපෘති ඇරඹීම සඳහා එකඟ වීමට මත්තෙන් පාරිසරික බලපෑම් සම්බන්ධයෙන් සෑම ආන්ඩුවක් ම නිරවද්‍ය පර්යේෂන කලයතු බව දැක්වේ.

සිය නම හෙලි නොකිරීමේ කොන්දේසිය මත ප්‍රකාශයක් කල ප්‍රමුඛ පෙලේ උත්තර ධ්‍රව මන්ඩල විද්‍යාඥයෙක් කියා සිටියේ වාර්තාවේ මධ්‍ය පනිවුඩය, ඛනිජ තෙල් හා ගෑස් ප්‍රයෝජනයට ගැනීම දැනට වඩා ප්‍රවේසම් සහගතව කල යුතු බවත් "උත්තර ධ්‍රැවයෙහි ඛනිජ තෙල් හා ගෑස් සඳහා කැනීම් කිරීමට ප්‍රථමයෙන් ලබා ගත් දත්තවල නිරවද්‍යතාවය හෙඳින් පිරික්සා බැලිය යුතු" බවත් ය.

## චුක්චි මුහුදේ ප්‍රතිලාභ

වාර්තාවෙහි නිගමන චුක්දි මුහුදෙහි එක්සත් ජනපදය හා රුසියාව විභව වසයෙන් අපහසුතාවයට පත් කරන්නක් බව උත්තර ධ්‍රැව සභාවේ විද්‍යාඥයෙක් කියා සිටියේ ය. එහි ඛනිජ තෙල් හා ගෑස් සඳහා කැනීම්වල පාරිසරික ගම්‍යයන් පූර්න වසයෙන් අවබෝධ කර ගැනීමට "වැඩි දුර පර්යේෂන හා අගැයීම් අවශ්‍ය වනු ඇතැ" යි ඔහු කියා සිටියේ ය.

වයඹදිග ඇලස්කාව හා නැගෙනහිර සයිබීරියාව අතර පිහිටා ඇති චුක්චි මුහුදෙන් ලබා ගත හැකි ඛනිජ තෙල් ප්‍රමානය බැරල් බිලියන 15ක් වසයෙන් ද ස්වාභාවික ගෑස් ප්‍රමානය  ඝන අඩි ට්‍රිලියන් 76ක් වසයෙන් ද ගනන් බලා ඇත. චුක්චි මුහුදෙහි ඇමරිකාව හිමිකම් කියන අක්කර මිලියන 30ක් ප්‍රයෝජනයට ගැනීමේ අයිතිවාසිකම් පෙබරවාරි 6වැනි දා වෙන්දේසි කරන බවට වර්ෂය ආරම්භයේ දී එක්සත් ජනපද මහ ආන්ඩුවේ ඛනිජ කලමනාකරන සේවාව ප්‍රකාශ කලේ ය. මෙය ඊට මත්තෙන් ප්‍රකාශිතව තිබූ දින වකවානුවලට පෙරාතුව ය.

ජනවාරියෙහි මොස්කව් හි කල  සංචාරයක දී එක්සත් ජනපද සහකාර රාජ්‍ය ලේකම් ක්ලෝඩියා මැක්මරේ රුසියානු ආන්ඩුවේ නියෝජිතයින් සමග උත්තර ධ්‍රැවය පිලිබඳව සාකච්ඡා කලා ය. එහි සම්පත් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන්, විශේෂයෙන් චුක්චි මුහුදු පත්ලෙහි ඇති සම්පත් සම්බන්ධයෙන්, සහයෝගිතාවයෙන් කටයුතු කිරීමට දෙරට තාවකාලික එකඟතාවයකට පැමින ඇති බවට ඉඟි පලවේ. සාකච්ඡා පැවතියේ "රුසියාව හා ඇමරිකා එක්සත් ජනපදය සම්බන්ධයෙන් පමනක් නොව, උත්තර ධ්‍රැවය දිශාවට මායිම්ව පිහිටි රටවල් පහම සම්බන්ධයෙන් ය"යි මොස්කව්හි පවත්වන ලද පුවත්පත් සාකච්ඡාවකදී මැක්මරේ පැවසුවා ය.

"පොදු උත්සුකයන් පවතින සියලු ක්ෂේත්‍ර තුල - ඛනිජ තෙල්, ගෑස් හා සංචාරක ව්‍යාපාරය තුල - අප එකමුතුව කටයුතු කල යුතු බව වඩාත් ප්‍රත්‍යක්ෂ වී ඇතැ"යි ඈ පැවසුවා ය.

චුකචි මුහුදෙහි ගවේෂන අයිතීන් ව්‍යාප්ති කිරීම කෙරේ බුෂ් පාලන තන්ත්‍රයෙහි හා ඇලස්කාවේ රිපබ්ලිකන් පාක්ෂික ආන්ඩුකාර සේරා පලින්ගේ ප්‍රබල සහාය ලැබේ. වසර 15කට පසු ප්‍රථම වතාවට ය, මෙම ප්‍රදේශයේ නව බලපත්‍ර සඳහා ඉල්ලුම් කිරීමට ඛනිජ තෙල් සමාගම්වලට වොෂිංටනය ආරාධනය කර ඇත්තේ. තෙල් ගවේෂනයට සීමාවන් පනවන ලද්දේ බොහෝ කොට ම පෘථිවියෙහි ඉතිරිව ඇති විශාල වනාන්තර පෙදෙස්වලින් එකකට එල්ල වූ තර්ජනයන් සම්බන්ධයෙන් එල්ල වූ පුලුල් මහ ජන විරෝධය හා විද්‍යාත්මක උධෘතයන් හේතු කොට ගෙන ය.

චුක්චි මුහුදු කලාපය වෙන්දේසියට ඉදිරිපත් කරන ලද්දේ කොංග්‍රසය සමග ගැටුමක් වැලැක්වීමට බව පුලුල් ලෙස පිලිගැනේ. වඳවී යෑමේ තර්ජනයට මුහුන පාන සත්ව වර්ග පිලිබඳ පනත යටතේ ආරක්ෂා කල යුතු සතුන්ගේ ලේඛනයට ධ්‍රැව වලහා ද එකතු කිරීමට කොංග්‍රසය දැනට සූදානම් වෙමින් සිටී. මේ පියවර හේතු කොට ගෙන ධ්‍රැව වලහාට ඉතිරිව ඇති අවසාන එක් ආරක්ෂිත වාසභූමියක් වන මේ ප්‍රදේශය ඛනිජ තෙල් හා ගෑස් සඳහා ප්‍රයෝජනයට ගැනීමට ඉඩ දීම වඩාත් දුෂ්කර කාර්යයක් වනු ඇත.

පූර්න වානිජමය කැනීම් ක්‍රියාත්මක වුවහොත් චුක්චි මුහුදෙහි මතුපිට ඛනිජ තෙල් තට්ටුවක් පැතිර යෑමට සියයට 40ක ඉඩක් ඇතැයි එක්සත් ජනපද ආන්ඩුවේ ආයතන පවා පිලිගෙන ඇත. ඉහිරුනු තෙල් ස්පර්ශවීම ධ්‍රැව වලසුන්ට හා වොල්රස් (මුහුදු සිංහයන්) වැනි අනිකුත් සත්ව වර්ගවලට ද බෙහෙවින් හානිකර වනු ඇතැයි පිලිගෙන ඇත.

සියලු පාරිසරික අන්තරායන් ගවේෂනය කොට සැලකිල්ලට ගෙන ඇතැයි ඛනිජ කලමනාකරන සේවාවෙහි අධ්‍යක්ෂ රැන්ඩොල් ලූති අවධාරනය කර ඇත. "අපගේ තීරනය යහපත් සමබරතාවකින් යුතු එකකැයි අපි විශ්වාස කරමු. එමගින් වෙරලබඩ වාසීන්ට වැදගත් වන සම්පත් ආරක්ෂා කෙරෙන අතර ම මේ කුතුහලය දනවන සීමා ප්‍රදේශය ගවේෂනය කිරීමට ඉඩ සැලසෙනු ඇතැ" යි ඔහු ප්‍රකාශ කලේ ය. වෙරලට සැතපුම් 50කට නුදුරින් කැනීම් කටයුතු තහනම් කිරීම මගින් වඳවී යාමේ තර්ජනයට මුහුන පාන ක්ෂීරපායී සතුන් ආරක්ෂා කෙරෙනු ඇතැයි එම ආයතනය ප්‍රකාශ කර සිටී.

එනමුදු, අයිස් තට්ටුවලින් ගහන මුහුදෙහි තෙල් කාන්දු වීමෙන් සිදු වන හානිය අවම කිරීමට ප්‍රමානවත් පියවර ගැනීමක් සිදු නොවන්නේ යයි එක්සත් ජනපදය කේන්ද්‍ර කර ගත් හා ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමුඛ පෙලේ උත්තර ධ්‍රැව සංරක්ෂන සංවිධාන ගනනාවක්ම පෙන්නුම් කොට ඇත.

උත්තර ධ්‍රැව මන්ඩලයේ වාර්තාව යටපත් කිරීම බුෂ් පාලන තන්ත්‍රයෙහි ස්වභාවයට ම ගැලපෙන බව එක්සත් ජනපදය කේන්ද්‍ර කර ගත් ජීව විද්‍යාත්මක විවිධත්වය පිලිබඳ කවයෙහි කාලගුන අධ්‍යක්ෂ කැසී සීගල් ප්‍රකාශ කර ඇත: "මෙය සෑම අවස්ථාවකදී ම කාලගුන විද්‍යාවෙහි වැදගත්කම අවතක්සේරු කිරීමේ, එය ප්‍රතික්ෂේප කිරීමේ හා යටපත් කිරීමේ රටාවකට අනුරූප වේ. මෙය සිය තනතුරුවල ගෙවන අවසන් මාස කිහිපය තුල කාබනික ඉන්ධන හිමිකම් උපරිම ප්‍රමානයක් හැකි ඉක්මනින් බෙදා දීමේ බුෂ්-චෙනි මූලෝපායෙහි කොටසකි.

## උත්තර ධ්‍රැවය සඳහා පොරය

උත්තර ධ්‍රැවයෙහි හයිඩ්‍රොකාබන් සඳහා කැනීම් කටයුතු, තෙල් හා ගෑස් සමාගම් විසින් බොහෝ කලක සිට ම සලකන ලද්දේ බොහෝ සෙයින් ආර්ථික වසයෙන් ඵලදායී නොවන කටයුත්තක් ලෙස ය. ඒ, දුරින් පිහිටි මේ කර්කශ ප්‍රදේශයෙහි ඛනිජ ප්‍රයෝජනයට ගැනීම සඳහා අති විශාල පිරිවැයක් අවශ්‍යවීම හේතුවෙනි. එසේ වුව ද, වර්තමානයෙහි තෙල් හා ගෑස් සඳහා පිරිවැය ඉහල යෑම ද වායුගෝලය උනුසුම් වීම හේතු කොට ගෙන ග්‍රීෂ්ම සෘතුවේ මුහුදේ අයිස් ප්‍රමානය අඩුවීම ද එකට ගත් කල බලශක්ති කර්මාන්තයට හා උත්තර ධ්‍රැවයට යාබඳ පිහිටි රටවල ආන්ඩුවලට මේ කලාපය වැඩි වැඩියෙන් ආකර්ෂනීය වී ඇත.

මේ හේතුවෙන් උත්තර ධ්‍රැව භූමිභාග සඳහා එන්ට එන්ට ම උග්‍රවන පොරයක් ඇරඹී ඇත. භෞමික අයිතීන් සඳහා ආරවුල් ගනනාවකින් මෙය ප්‍රකාශිත වේ. රුසියාව හා ඩෙන්මාර්කය විසින් උත්තර ධ්‍රැවයේ ස්වෛරීභාවය පිලිබඳ ප්‍රතිවාදී හිමිකම් කියාපෑම් පසුගිය වසර තුලදී තීව්‍ර වී ඇත. සිය ස්ථාවරයන් සාධාරනීකරනය කිරීම පිනිස දෙරට ම ඉහල මට්ටමේ මැදිහත්වීම්වල යෙදී සිටිති. මොස්කව් හි "මූලෝපායික, ආර්ථික, විද්‍යාත්මක හා ආරක්ෂක අවශ්‍යතා" කෙරේ උත්තර ධ්‍රැවය අතිශයින් වැදගත් වන බව රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් ප්‍රකාශ කර ඇත.

මෑත වසරවල දී එක්සත් ජනපදය කැනඩාව හා නෝර්වේ රාජ්‍යයන් ද කලාපයෙහි සිය භෞමික හිමිකම් පෑම සඳහා ආක්‍රමනශීලීව මැදිහත් වෙමින් සිටී. ඔටාවා (කැනඩාව) එම ප්‍රදේශ තුල යෙදවීම සඳහා මුර සංචාරක නැව් අටක් තැනීම අරඹා ඇති අතර උත්තර ධ්‍රැවයට සැතපුම් 400කට අඩු දුරක තුල රෙසලියුට් නමැති ජන කොටසක් වාසය කරන ප්‍රදේශය හමුදා පුහුනුකිරීම් ඒකකයක් ස්ථාපිත කොට ඇත. උත්තර ධ්‍රැවයෙහි අධිකාරය සඳහා එක්සත් ජනපදය හා කැනඩාව අතර දිගු කාලීන ආරවුල් පවතී. විශේෂයෙන්ම දියවී යන මුහුදු අයිස් තට්ටු හේතුකොට ගෙන විවෘත විය හැකි විභව වශයෙන් ලාභදායී නාවික මාර්ග සම්බන්ධයෙන් මේ ආරවුල් පවතී.

උත්තර ධ්‍රැවය අරභයා භෞමික හිමිකම් සම්බන්ධයෙන් එක්සත් ජනපද ප්‍රතිපත්තියෙහි වෙනසක් විශ්ලේෂකයින්ගේ නිරීක්ෂනය බඳුන්වී තිබේ. මුහුදු පිලිබඳ නීති සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සම්මුතියට අත්සන් තැබීම වොෂින්ටනය මේ දක්වා ම ප්‍රතික්ෂේප කොට ඇත. මේ සම්මුතිය වූ කලි, මිදුනු උත්තර ධ්‍රැවය ද ඇතුලුව, මුහුදු සම්බන්ධයෙන් ප්‍රතිවාදී හිමිකම් පිලිබඳ තීරන ගැනීමට විසඳුම් ඉදිරිපත් කිරීමේ දී උපයෝගී කර ගන්නා උපක්‍රමයයි. උත්තර ධ්‍රැවයෙහි විශාල ප්‍රදේශවල අධිකාරය සඳහා අනිකුත් උතුරුදිග බලවතුන් වැඩි වැඩියෙන් තරග වදිත් ම ඇලස්කාවට උතුරින් පිහිටි මුහුදු පත්ලට සිය හිමිකම් ඉදිරිපත් කිරීම සඳහා දැන් මේ සම්මුතියට අත්සන් කිරීමට වොෂිංටනය කැමැත්තෙන් සිටින බව පෙනී යයි.

කලාපයෙහි වර්ධනය වූ ජාත්‍යන්තර ආතතීන්, ස්වීඩන් පාර්ලිමේන්තුවෙහි මෑතක දී පවත්වන ලද සම්මන්ත්‍රනයක මාතෘකාව විය. සම්මන්ත්‍රනය සංවිධානය කරන ලද්දේ ස්වීඩනයේ උත්තරධ්‍රැව සංවිධාන ගනනාවක් විසිනි. උත්තර ධ්‍රැවයේ ස්වාභාවික සම්පත් සඳහා සටන ගැටලු සහගත වන බව එහිදී පිලිගැනුනි. තෙල් හා ගෑස් කැනීම් පිලිබඳව වඩාත් පැහැදිලි ජාත්‍යන්තර නියාමයන් ස්ථාපිත කල යුතු බවට එහි දී බල කෙරුනි.

"උත්තර ධ්‍රැවයෙහි පාරිසරික හා භූ-දේශපාලනමය අන්තරායන් පවතී. මේ හේතුන් නිසා උත්තර ධ්‍රැවයෙහි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නියාමයන් පිලිබඳව එකඟත්වයකට පැමිනිය යුතු ය. නිදසුනක් වශයෙන්, පාරිසරික ප්‍රමිතීන් සකස් කල යුතු ය" යි ස්ටොක්හෝම්හි ජාත්‍යන්තර කටයුතු පිලිබඳ ආයතනයෙහි අධ්‍යක්ෂ, ටොමස් රීස්, කියා සිටියේ ය.

කලාපයෙහි ස්වදේශික ජනතාව තමන් දිවිගෙවන පෙදෙස් සම්බන්ධයෙන් තීරන ගැනීමට ප්‍රමානවත් ලෙස සම්බන්ධ නොවන බවත් බලශක්ති කර්මාන්තයෙහි ව්‍යාපෘතිය හේතු කොට ගෙන බොහොමයක් ප්‍රජාවන්ට තම නිවෙස් අත් හැර දැමීමට සිදු වී ඇති බවත් උත්තර ධ්‍රැව සභාවේ දේශීය ජනතා මහලේකම් කාර්යාලයෙහි ලේකම් ජනරාල් රූන් ෆ්ජෙල්හයිම් සම්මේලනයෙහි දී කියා සිටියේ ය.

උත්තර ධ්‍රැව සභාවේ වාර්තාවෙහි නිගමන වොෂිංටනය විසින් යටපත් කිරීම, තමන්ට අවාසිදායක වන විද්‍යාත්මක නිගමනවලින් මිදීමට ගන්නා ලද උත්සාහයකට වැඩි යමක් නිරූපනය කරයි. උත්තර ධ්‍රැවය හා එහි අති විශාල ඛනිජ සම්පත් පිලිබඳ හිමිකම් කියන රටවල් අතර සහයෝගිතාව බිඳවැටීම සම්බන්ධයෙන් ද එමගින් පෙර නිමිති පායි.

© www.wsws.org